**ශීර්ෂය - 217** පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

---------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 217-පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 ගිණුම්කරණ අඩුපාඩු

**දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපදේශන ගාස්තුද ඇතුලත්ව රු.2,350,000ක පිරිවැයක් දරා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේදී කාලීන හා නිවැරදි වාර්තා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය සඳහා 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත පවරන ලද UNCRC දත්ත පද්ධතිය මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි.මෙම දත්ත පද්ධතිය ක්‍රියාත්මක නොකොට නිෂ්කාර්යව පැවතුණි. | UNCRC දත්ත පද්ධතියක අවශ්‍යතාවය හඳුනා ගැනීමේ හා නිර්මාණය කිරීමේ කටයුතු ඇතුලු සියලු ප්‍රසම්පාදන හා ගෙවීම් කටයුතු සිදුකර ඇත්තේ අමාත්‍යාංශය මගින් වේ. ඒ අනුව වත්කමක් ලෙස මෙම පද්ධතිය හඳුනා ගත යුතුනම් එලෙස හඳුනාගෙන අමාත්‍යංශයේ වත්කම් ලේඛනයට ඇතුලත් කර ඇතිදැයි සොයා බලා එසේ ඇතුළත් කර නොමැති නම් අපගේ වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු කර ඔබ වෙත වාර්තා කරන බව. | තාක්ෂණික මෘදුකාංග පද්ධති වත්කම් ලෙස හඳුනාගත යුතු අතර එකී දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමට වගබලා ගතයුතු වීම. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

## 2.1 කාර්යභාරය ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතරට ගැනෙන ළමා මූලික පර්යේෂණ පැවැත්වීම වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මට අනුව වසර තුළ ළමා මූලික පර්යේෂණ 03ක් සිදු කිරීමට සැලසුම් කර රු.95,000ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද වසර තුල ළමා මූලික පර්යේෂණ කිසිවක් සිදුකර නොතිබීමෙන් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යයන් කෙරෙහි අවධානය යොමුකර නොමැති බව අනාවරණය විය. | මෙම කාලවකවානුව තුල පැවති උග්‍ර ඉන්ධන අර්බුදය, දරුවන් ඒකරාශී කරගැනීමේ අපහසුතා, කොරෝනා වසංගත තත්ත්වය සම්පූර්ණයෙන් පහව නොයාම ආදී ප්‍රායෝගික ගැටළු ඇතිවිය. මේ හේතුවෙන් සැලසුම් කල අයුරින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව | ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කලයුතුය. |

## 2.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------------------------ | ------------ |
| (අ) | ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම හා ළමුන්ට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් මෙහෙයුම් කමිටු සක්‍රිය ලෙස පවත්වාගෙන යෑමේ අරමුණෙන් සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික්ක 25 ක ග්‍රාම නිලධාරී වසම් 335ක් සඳහා රු.3,249,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එක් ග්‍රාම නිලධාරී වසමකින් එක් කාර්තුවකට එක් ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවක් බැගින් වසර තුල කමිටු 1340 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණද, අදාල ලිපිගොනු පරීක්ෂාවේදී කමිටු 405ක් පමණක් පවත්වා රු.3,080,000ක වියදමක් දරා තිබුණි. වසර තුළ පැවැත්වීමට ඉලක්ක කල කමිටු සංඛ්‍යාවෙන්, කමිටු රැස්වීම් පැවැත්වීමේ ප්‍රගතිය සියයට 30 ක් වුවද මූල්‍ය ප්‍රගතිය සියයට 95 විය. | වසර තුළ කමිටු 1340 ක් පැවැත්වීමට ප්‍රතිපාදනයන් වෙන් කර තිබූ නමුත්, ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට නිළධාරීන් අනුයුක්ත කර නොතිබීම හා කාර්තු ක්‍රමයට අයවැය යොමුකරන ලද බැවින් අක් මුදල් ලබා ගැනීමේ අපහසුතාවය මත කමිටු පැවැත්වීමට අපහසු වී ඇති බව. | මුළු ප්‍රතිපාදනයෙන් සියයට 95 වියදම් කර ඇති බැවින් අක්මුදල් ලබා ගැනීමේ අපහසුතාවය මත කමිටු පැවැත්වීමට අපහසු වූ බව පිළිගත නොහැක. අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ළමා මෙහෙයුම් කමිටු පැවැත්වීමේ ලිපිගොනු හා ප්‍රගති වාර්තා අනුව ළමා මෙහෙයුම් කමිටු පැවැත්වූ බවට සනාථ නොවන කමිටු රැස්වීම් ගණන 935වූ අතර, එය සියයට 70 ක ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණි. | ළමා හිමිකම් ප්‍රවර්ධන නිළධාරීන් /ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර නිළධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලද වෘත්තීය ක්‍රියාමාර්ග හේතුවෙන් ප්‍රගතිය වාර්තාවී නොමැති බව.<br><br>එසේ වුවද දුරකථනයෙන් හා වට්ස්ඇප් මාර්ගයෙන් තොරතුරු ලබා ගෙන යාවත්කාලීන කලද තහවුරු කිරීමට ලේඛන ගොනුව තුල ඇතුලත් නොවූ බව. | ප්‍රගතිය විධිමත්ව ලබා ගැනීමට හා ලිපිගොනු යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 අනුමත ක්‍රියාකාරී සැලැස්ම අනුව නිවුන් දරු ආධාර ලබා දීම සඳහා පවුල් ඒකක 142ක් ඉලක්ක කර ගනිමින් රු.1,098,500ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර වසර තුළ රු.1,076,000ක් වැය කර සියයට 98ක ප්‍රගතියක් ලබා ඇති බව දක්වා තිබුණි. එහෙත් විගණනයට ඉදිරිපත් වූ ලිපිගොනු අනුව පවුල් 86 ක් පමණක් ආධාර මුදල් ලබා ගත් බවට සනාථ වූ අතර ඉන් ආධාර මුදල් ලබාගත් බවට පවුල් ඒකක 56ක් විසින් ලදුපත් ඉදිරිපත් කර නොතිබුණි. | නිවුන් දරු අධාර ලබා දුන් පවුල් ඒකක 135ට අදාළව ප්‍රතිපාදන ලබා දී ඇති නමුත් පෙබරවාරි සිට අගෝස්තු මාසයේ අවසාන භාගය දක්වා ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්/ සහකාර නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලද වෘත්තීය ක්‍රියාමාර්ග හා පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රගති වාර්තා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොමැති බව. ඉදිරියේදි නිසි පරිදි ලේඛන නඩත්තු කිරීමට කටයුතු කරන බව. | ප්‍රගති වාර්තා නිසි පරිදි ගෙන්වා ගතයුතු අතර ලබා දී ඇති ආධාර මුදල් තහවුරු කර ගැනීමට හැකිවන පරිදි ලිපිගොනු විධිමත්ව යාවත්කාලීන කල යුතුය. |

## 2.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොමැති බව.<br><br>ඉදිරියේදී මෙලෙස මඟහැරීම් සිදු නොවන ලෙස කටයුතු කිරීමට පියවර ගන්නා බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොරකාන, ගල්කණුව පාරේ පිහිටි දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි කිහිපයක් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | 2021 වසරේ දී කොවිඩ් අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස භාවිත කිරීම සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම්ගේ ඉල්ලීම පරිදි ලබා දී ඇති බව. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම මධ්‍යස්ථානවල තිබූ තාවකාලික | පවතින සම්පත් උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | ඉදිකිරීම් ඉවත් කර ඇත්තේ 2023 ජනවාරි මස වන අතර, මේ වන විට රෝහලක් ලෙස භාවිත කරන ලද මධ්‍යස්ථානය අදාළ අලුත්වැඩියාකිරීම් සිදුකෙරෙමින් පවතින බව. | |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය<br>----------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------ | නිර්දේශය<br>------------- |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර 2014 අගෝස්තු මාසයේ සිට පුරප්පාඩුව පැවතුණි | අයදුම්කරුවන් 28 දෙනෙකු සඳහා 2022.04.06 හා 07 දින සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. නමුත් සුදුසුකම් සපුරන අයදුම්කරුවන් නොසිටි බැවින්, බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වූ බව. මේ වන විටත් මුදල් අමාත්‍යංශය මඟින් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති බව. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |